# ස්වේච්ඡා සංචාරක සේවය සහ ළමා ලිංගික සූරාකෑම

ආයතනගත දරුවන් ස්වෙච්චා සංචාරක සේවා හේතුවෙන් දැඩි අවදානමට ලක් විය හැක. කොට්ටාශය වශයෙන් හදුනාගත හැක බොහෝ අවස්ථාවන්හීදී, අනාථ නිවාසවල ජීවත් වන දරුවන් ඇත්ත වශයෙන්ම අනාථ දරුවන් නොවන නමුත් ඔවුන්ගේ පවුලේ ගැටලුකාරී තත්වයන් හෝ දරිද්‍රතාවය හේතුවෙන් එම ආයතනවලට ඇතුළත් කර ඇත.

කිසිදු පසුබිම් පරීක්ෂාවකින් තොරව, සංවිධානයක හෝ අනාථ නිවාසයක ළමුන් සමඟ හෝ ඔවුන් වෙනුවෙන් වැඩ කිරීම සදහා ස්වේච්ඡා සේවකයන්ට අවසර ලබාදීම ඇතුළුව ස්වේච්ඡා සංචාරක සේවා නිසිපරිදි නියාමනය නොකිරීම හේතුවෙන් අපරාධ කරුවන් ඉතා පහසුවෙන් තම අවශ්‍යතා ඉටුකරගැනීම සදහා ආයතන ගත දරුවන් ඉලක්ක කරයි.

සංචාරකයින් හට නිසි අධීක්ෂණයකින් තොරව ස්වේච්ඡා සේවා සැපයීමට ඉඩ ලබාදීම සහ ආයතනගත  දරුවන් සමගින්  සබඳතා ගොඩනගා ගැනීමට අවසර දීම දරුවන් ඉතා පහසුවෙන් ලිංගික සූරාකෑමට හසුකර ගැනීමට ඔවුන්ට අවශ්‍ය  පසුබිම සකසා දේ.

## එබැවින්, ස්වේච්ඡා, සංචාරක ක්ෂේත්‍රය හා සම්බන්ධ සියලුම සංවිධාන

සියලු දෙනාගේ ආරක්ෂාව සහතික කිරීම සහ ස්වේච්ඡා සේවයට අදාළව දැඩි ජාතික රෙගුලාසි පැනවීමට, විශේෂයෙන්ම ළමුන් සමඟ වැඩ කිරීමට කැමති ස්වේච්ඡා සේවකයන් සඳහා පසුබිම් පරීක්ෂා කිරීම්, සම්මුඛ පරීක්ෂණ සහ පිළිගත් පුද්ගලයින්ගේ අනුමැතිය ලබාගැනීම අනිවාර්ය කළ යුතු වේ.

# අපගේ දරුවන් ආරක්ෂා කිරීමට ඔබත්

■ දරුවන් ලිංගිකව සූරාකෑමේ චේතනාවෙන් යමෙකු ඔබ හෝ වෙනත් අයෙකු වෙත ළඟා වන්නේ නම් එය සාපරාධී වරදක් බවත් දඩුවම ඉතා දරුණු බවත් ඔවුන් හට දන්වන්න.

■ හැකි නම්, ඔවුන්ගේ නම, අනන්‍යතාවය, ඔවුන්ව සම්බන්ධ කරගත හැකි ආකාරය සහ අනෙකුත් වැදගත් තොරතුරු ලබාගෙන  අදාළ  බලදරින්ව දැනුවත් කරන්න.

■ දරුවන් ඉතා පහසුවෙන් අවදානමට ලක්විය හැක, එම නිසා ඔවුන්ට අපගේ  සහයෝගය අවශ්‍යය බව නිතර සිහි තබාගන්න.

**හිතවතුනි**
**ඔබේ දරුවන්ගේ ආරක්ෂාව ගැන දැඩි අවධානයක් යොමු කරන්න!**
**නිරතුරුව අවදියෙන් හා සුපරීක්ෂාකාරීව සිටින්න.**

**ළමා ආරක්ෂාව අප සැමගේ වගකීමකි!**
**එබැවින් අද සිට ඔබද සදාචාරසම්පන්න සංචාරකයෙකු වන්න!**

යම්කිසි ළමා අපයෝජනයක්  හෝ  සහ සූරාකෑමක් පිළිබදව  ඔබ දන්නේ නම් කරුණාකර පහත සදහන් ආයතන වෙත දැනුම් දෙන්න:

- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 1929
- පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය 011 2 444 444
- පීස් සංවිධානය 011 281 9397

info@ecpat.lk
www.ecpat.lk

SRI LANKA

PEACE

# දරුවන් ආරක්ෂා කරමින් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරමු



**පරිසරය සහ සැමතැන වෙසෙන ළමුන් සුරැකීමේ සංවිධානය**

# සංචාරක ව්‍යාපාරය යනු

සංචාරක ව්‍යාපාරය යනු "පුද්ගලික/ව්‍යාපාරික හෝ වෘත්තීය අරමුණු සඳහා මිනිසුන් තම සුපුරුදු පරිසරයෙන් පිටත රටවලට හෝ ස්ථානවලට සංක්‍රමණය වන සමාජ, සංස්කෘතික සහ ආර්ථික සංසිද්ධියකි" (UNWTO)




## අප රටට සංචාරක කර්මාන්තය වැදගත් වන්නේ ඇයි?

සංචාරක ව්‍යාපාරය යනු ශ්‍රී ලංකාවෙහි විදේශ මුදල් ඉපැයීමේ තුන්වන විශාලතම මූලාශ්‍රය වේ.

තවද සංචාරක ව්‍යාපාරය ආර්ථික වර්ධනයට සහ කලාපීය ආදායම් විෂමතාව අඩු කිරීමට සෘජු දායකත්වයක් සපයයි.

## ශ්‍රී ලංකාව තුළ සංචාරක ව්‍යාපාරය

ශ්‍රී ලංකාව යනු අසමසම ස්වභාව සෞන්දර්යයෙන් සමන්විත රටක් වන බැවින් ලොව පුරා සංචාරකයින් ඊට ආකර්ෂණය වේ.

ශ්‍රී ලංකාව බොහෝ හේතු නිසා සුප්‍රසිද්ධ සංචාරක ගමනාන්තයක් බවට පත්ව ඇත, ස්වභාව සෞන්දර්යය විඳගැනීම, ආයුර්වේද ප්‍රතිකාර ලබා ගැනීම, සංස්කෘතික/ඓතිහාසික ස්ථාන ගවේෂණය, අධ්‍යාපනික ක්‍රියාකාරකම් සහ සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීම, ප්‍රජා සංවර්ධනය යන කාරනා මේ අතර ප්‍රධාන වේ.

## ස්වේච්ඡා සේවා සංචාරය සංචාරක ව්‍යාපාරය

ස්වේච්ඡා සේවා සංචාරය යනු යමෙක් නිවාඩුවක් ගත කරන කාලය අතර තුර අදාල ස්ථානයේ ජීවත් වන ප්‍රජාව ගේ සුබසිද්ධිය උදෙසා නොමිලේ වැඩ කිරීමේ ක්‍රියාවලියයි.

ස්වේච්ඡා සේවකයා විසින් ඔහුගේ/ඇයගේ සේවාවන් කිසිදු ගාස්තු අයකිරීමකින් තොරව සපයයි.

ඔවුන්ගේ ගමනාන්තය ළමා නිවාසයක්, ළමාරක්ෂක ආයතනයක් හෝ පාසලක් විය හැකිය.

ලොව පුරා සංචාරක සහ සංචාරක සේවාවන් අනිසි ලෙස භාවිතා කරන විදේශීය සහ දේශීය අපයෝජකයන් විසින් ඕනෑම වයසක, ඕනෑම ලිංගික දිශානතියක සහ විවිධ පසුබිම්වලට අයත් දරුවන් ලිංගිකව සූරාකෑමේ දැඩි අවදානමක් ඇත.

**"සෑම සංචාරකයෙකුටම මේ රටෙන් ලබාගැනීමට යමක් ඇත"**




## සංචාරක ව්‍යාපාරය තුල සිදුවන සදාචාර විරෝධී ක්‍රියා.

සංචාරකයින් බොහෝවිට ලැගුම් ගැනීම සඳහා හෝටල්, නිවාඩු නිකේතන, ලැගුම්හල්, නේවාසිකාගාර සහ තම මිතුරන්ගේ වාසස්ථාන තෝරාගනී තවද ඔවුන් තම ජීවිතයේ කිසිදාක හමුවී නොමැති පවුල් සමඟ පවා රැඳී සිටිති.

අවාසනාවකට, සංචාරක ව්‍යාපාරය බොහෝ සමාජ ගැටලු ද ගෙන එයි, ඒවායින් එකක් වන්නේ ළමයින් සහ තරුණයින් සංචාරක ව්‍යාපාරය තුළ ලිංගික සූරාකෑමට ලක්වීමයි, මෙම අපරාධය වසර ගණනාවක් මුළුල්ලේ සිදුවන්නක් වන අතර එය තවමත් බොහෝ රටවල් තුල ප්‍රචලිතව පවතී.

අපේ රටේ ආර්ථිකය නංවාලීමට සංචාරක ව්‍යාපාරය බොහෝ උපකාර වන නමුත් සමහර සංචාරකයින් අප ආගන්තුක සත්කාරයන්ගෙන් ප්‍රයෝජන ගෙන සදාචාර විරෝධී ක්‍රියාවන්හි යෙදෙන බව නොරහසකි.

මෙහිදී තරයේ සිහි තබා ගත යුතු කරුණක් වනුයේ වයස අවුරුදු 18ට අඩු බාලවයස්කරුවන් ලිංගික තෘප්තිය සඳහා යොදා ගැනීම දඬුවම් ලැබිය හැකි වරදක් බවයි.